**ශීර්ෂය 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) වාර්තාවේ අංක 1.6.1(ආ), 1.6.2(අ)(ඇ), 1.6.8, 1.6.9, 1.6.10(අ), 1.6.10(ඇ)(iv) සහ 1.6.10(ඇ) යන ඡේද සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් රු. 121,281,523 ක් වැඩියෙන් දක්වා තිබූ අතර, අත්තිකාරම් හරස් සටහන් ගෙවීම් රු. 41,149,751 ක් ඇතුළත් කර නොතිබුණි. | ගැලපීම් නිවැරදිව හඳුනාගෙන භාණ්ඩාගාර පොත්වලට ගැලපෙන ආකාරයට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු බව. | අග්‍රිම ශේෂයට ගිණුම් ගැලපීමට යාමේදී සහ අත්තිකාරම් බී ගිණුමේ ගනුදෙනු ගැලපීමේදී වෙනත් ලැබීම් වැඩියෙන් ගැලපී ඇති බව හා හරස් සටහන් වියදම ගැලපී නොමැති බව. |
| (ආ) සමෘද්ධි බැංකු විසින් ඉතිරි වී ආපසු එවන ලද රු. 2,139,044 ක් වැය ලෙජරයට අධිභාර නොකර රජයේ ආදායමට බැර කර තිබීම හේතුවෙන් රජයේ සහනාධාර වියදම වැඩියෙන් පෙන්වා තිබුණි. එම ආපසු ලැබුණු ඉතිරි සහනාධාර මුදලට අදාළව අරමුදල් දෙකකට හා අනිවාර්ය ඉතිරි කිරීම්වලට වැඩිපුර බැරකළ දායක මුදල් ආපසු ලබාගෙන ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට ද කටයුතු කර නොතිබුණි. | මාසික තථ්‍ය සහනාධාර වියදම නිවැරදිව ගණනය කර අවශ්‍ය ගැලපීම් කළ යුතු බව. | උපරිම වාර්තාවට අනුව ගෙවන ලද සහනාධාරවල සිදුවන වෙනස්වීම් ගැලපීම සඳහා චක්‍රලේඛ මඟින් උපදෙස් ලබාදී ඇති බව හා අරමුදල්වලට හා අනිවාර්ය ඉතුරුම්වලට වැඩිපුර බැර කළ දායක මුදල් නැවත ලබාගැනීමේ ක්‍රමවේදයක් සකස් කරන බව. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2020 ජුනි 30 දින වන විට භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් වී නොතිබූ බැවින් 2019 දෙසැම්බර් 31 දිනට රු. 989,122,878 ක් වශයෙන් දක්වා තිබූ මූල්‍ය නොවන වත්කම්වල භෞතික පැවැත්ම සනාථ කරගත නොහැකි විය. | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර වත්කම්වල නිවැරදිතාවය සනාථ කළ යුතු බව. | කොවිඩ්-19 උවදුර හේතුකොට ගෙන තැපැල් මඟින් වාර්තා ලැබීම ප්‍රමාද වී ඇති බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අත්පත් කරගත් වටිනාකම රු. 1,577,406 ක් වූ මූලධන වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | මිලදී ගැනීම් එම වර්ෂය තුළම භාණ්ඩාගාරයට වාර්තා කර ගිණුම්වලට ඇතුළත් කළ යුතු බව. | 2019 වර්ෂයේ මිලදීගත් එම වත්කම් ගැලපී ඇත්තේ 2020 වර්ෂයේදී බව. |
| (ඇ) | 1996 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුළ අත්පත් කරගත් ඉඩම් 10 ක් තක්සේරු කිරීමට කටයුතු නොකර වටිනාකම රු. 36,000 ක සිට රු. 6,855,326 ක් අතර පරාසයකින් ගිණුම්වල දක්වා තිබුණි. | ඉඩම් තක්සේරු කර ගිණුම් ගත කළ යුතු බව. | ඉඩම් 05ක් පවරා ගැනීමට හා ඉඩම් 02 තක්සේරු කිරීමට කටයුතු කරමින් පවතින බව හා ඉඩම් 02 ක් පවරා ගෙන නොමැති බව. |

### 1.6.3 අක් මුදල් ගැලපුම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂය අවසානයේ මුදල් පොතට අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු හෝ භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු අගය නිරීක්ෂණය වන පරිදි අක් මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව අක් මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කළ යුතු බව. | අග්‍රිම සැසඳීම් ප්‍රකාශය නිවැරදිව පිළියෙල කර වර්ෂ අවසානයේ අග්‍රිම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරන බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 208 මගින් අනෙකුත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු විසින් වැය කර තිබූ රු. 1,675,405 ක් අඩුවෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි. | අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට නිවැරදිව ගැලපීම් කළ යුතු බව. | මුදල් රෙගුලාසි 208 යටතේ වන වියදමක් ලෙස සටහන් නොවීම මෙම දෝෂයට හේතු වන බව. |

## 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අග්‍රිම ශේෂය රු. 1,295,857 ක් මුදල් ගලායාම් වශයෙන්ද, මුදල්වල ශුද්ධ වෙනස් වීමක් නොතිබියදී එය රු. 5,296,356,178 ක් වශයෙන්ද හා අත්තිකාරම් හරස් සටහන රු. 41,149,751 ක මුදල් ගලා යාමක් වශයෙන්ද දැක්වීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදිතාවය සනාථ කළ නොහැකි විය. | මුදල් ගලා ඒම හා ගලා යාම නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කළ යුතු බව. | හඳුන්වා දී තිබූ නව ආකෘතිය භාවිතයට නොගැනීම හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දෝෂ නිරූපණය වී ඇති බව. |

## 1.6.5 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කිරීම සඳහා අයවැය ප්‍රතිපාදන ලබා නොගෙන උපයන ආදායමින් වියදම් ආවරණය කර කර ගැනීමෙන් පසු රු. 5,397,212 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන රු. 3,084,699 ක් පමණක් රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. | 2015 ජුනි 24 දිනැති අංක 243/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | පුහුණු මධ්‍යස්ථාන නඩත්තුව සඳහා ආදායමින් 20% ක් රඳවා ගැනීමට දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලන බලතල පැවරීම අනුව බලය ලබා දී ඇති බව. |
| (ආ) | විවිධ වැඩසටහන් සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාලවලට ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශයෙන් ලබා දී තිබූ මුදලින් ආපසු එවා තිබූ රු. 2,199,126 ක් එම අංශයට නිරවුල් කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | අංශවලට පියවිය යුතු මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා නොගත යුතු බව. | තැන්පතු වෙන් කර හඳුනා නොගැනීම හේතුවෙන් සිදු වී ඇති මෙම දෝෂය 2020 අවසානයේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමෘද්ධි සහනාධාර ගෙවීම සඳහා බැංකු මූලා අංශයෙන් ලබාගත් රු.මිලියන 3,457.3 කින් තව දුරටත් පියවිය යුතු රු.මිලියන 2,374.5 ක මුදල බැරකමක් වන නමුත් එය පොදු තැන්පත් ගිණුම යටතේ පෙන්වා තිබුණි. | බැරකම පියවා ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගත යුතු බව හා ගිණුම්වලින් නිවැරදිව හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු බව. | භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීම හේතුවෙන් පියවා ගැනීමට නොහැකි වූ මෙම බැරකම තැන්පත් ගිණුමෙහි නිරූපණය කර තිබීමෙන් ශුද්ධ වත්කමට බලපෑමක් වන බව . |
| (ඈ) | ප්‍රචාරන අරමුදලේ ගනුදෙනු භාණ්ඩාගාරයේ අවසරය ලබා නොගෙන පොදු තැන්පත් ගිණුම පාවිච්චි කර සිදු කිරීමෙන් අනතුරුව සමාලෝචිත වර්ෂය අවසානයට රු. 17,360,531 ක ශේෂයක් පැවතුණි. | භාණ්ඩාගාරයේ අවසරය ලබාගත යුතු බව. | ප්‍රචාරණ අරමුදලට අයත් තැන්පතු ශේෂය වර්ෂ අවසානයේ පියවීමක් සිදු නොකරන බව. |
| (ඉ) | 2019 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ඉතිරි ශේෂය රු. 84,296,720 ක් වන්දි හා පාරිතෝෂික ගෙවීම සඳහා පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබූ අතර, 2020 ජූනි මාසය වන විටත් එයින් කිසිදු ගෙවීමක් සිදු කර නොතිබුණි. | අක් මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගැනීමට කටයුතු නොකළ යුතු බව. | පාරිතෝෂිත බැරකමෙන් කොටසක් පියවීම සඳහා ලියන ලද චෙක්පත, බැංකු වෙත මුදල් නිදහස් කිරීමේ අදහසින් අවලංගු කර තැන්පත් ගිණුමට බැර කළ බව. |

### 1.6.6 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ණය ලේඛනය අනුව අය විය යුතු ණය ශේෂය රු. 58,021,484 ක් වුවද, රු. 8,990,000 ක් වූ ණය භාණ්ඩාගාරයට වාර්තා නොකිරීම නිසා සැසඳුම් ප්‍රකාශයට භාණ්ඩාගාර පොත් අනුව පැවති ණය ශේෂය ලෙස රු. 49,031,484 ක් ඇතුළත් කර තිබුණි. | සියළු ගැලපීම් භාණ්ඩාගාරයට වාර්තා කර අත්තිකාරම් ගිණුමෙන් නිවැරදි තත්ත්වය හෙළිදරව් කළ යුතු බව. | දිස්ත්‍රික්කයකින් ගෙවන ලද රු 8,990,000 ක උත්සව අත්තිකාරම් වියදම වාර්තා නොකිරීමේ වරද නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. |

### 1.6.7 සීමා ඉක්මවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ලැබීම්වල අවම සීමාව රු. 275,000,000 ක් වුවද, තත්‍ය ලැබීම රු. 271,047,936 ක් වීමෙන් රු. 3,952,064 කින් අනුමත අවම ලැබීම් සීමාවට ලඟාවී නොතිබුණි. තවද, උපරිම වියදම් සීමාව හා උපරිම හර ශේෂ සීමාව පිළිවෙලින් රු. 325,000,000 ක් හා රු. 325,000,000 ක් වුවද, එම තත්‍ය අගයන් පිළිවෙලින් රු. 252,277,349 ක් හා රු. 58,021,484 ක් විය. භාණ්ඩාගාර අනුමැතියකින් තොරව පවත්වාගෙන යනු ලබන සේවක ණය චක්‍රීය අරමුදලින් සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 182 කුට රු. 37,939,566 ක ණය ලබා දීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | සීමා සංශෝධනය කිරීම් බලාත්මක කර ගිණුමට ඇතුළත් කළ යුතු බව හා සේවක ණය චක්‍රීය අරමුදල පවත්වාගෙන යාම භාණ්ඩාගාරයේ උපදෙස් මත ක්‍රියාත්මක විය යුතු බව. | විගණන විමසුමට පිළිතුරු ලබා දී නොමැත. |

## 1.6.8 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතු බව. | අදහස් දක්වා නැත. |
| **(ආ) වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනයක පවත්වා නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගත යුතු බව. | අදහස් දක්වා නැත. |
| **(ඇ) හානි පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 110 හා 104(i) ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | හානි වීම් පිළිබඳ පරීක්ෂණ කටයුතු කර ලේඛනය යාවත්කාලීන කළ යුතු බව. | පසුව පිළිතුරු සපයනු ලබන බව. |

## 1.6.9 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------- | ------------- | ------------------------ |
| (අ) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අදහස් දක්වා නැත. |
| (ආ) | විගණකාධිපතිවරයාට අවශ්‍යවන පරිදි නිශ්චිත කාල සීමාවක් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.8 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | සඳහන් කාලසීමාව තුළ පිළිතුරු ලබා දීම සඳහා අභ්‍යන්තර වැඩ පිළිවෙලක් යොදනු ලබන බව. |

1.6.10 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව (නිරීක්ෂණය) | අනුකූල නොවීම (නිරීක්ෂණය) | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 2013 අංක 01 දරන දිවිනැගුම (සමෘද්ධි)පනත | | | |
| (i) 5 (ඊ) වගන්තිය | දිවිනැගුම ප්‍රජාමූල සංවිධාන, දිවිනැගුම ප්‍රාදේශීය සංවිධාන, දිවිනැගුම දිස්ත්‍රික් කමිටු, දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා දිවි නැගුම ප්‍රජාමූල බැංකු සමිති විගණකාධිපතිවරයාට විගණනය කිරීමට හැකි වන පරිදි ප්‍රතිපාදන ඇතුළත් කර නොතිබුණි. | විගණනය සඳහා ප්‍රතිපාදන ඇතුළත් කළ යුතු බව. | රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් ලබාගැනීමෙන් අනතුරුව රාජ්‍ය ගිණුම් කාරක සභාව තීරණය කළහොත් පමණක් පනත සංශෝධය කළ හැකි බව. |
| (ii)36 හා 37 වගන්තිය | දිවිනැගුම (සමෘද්ධි) සංවර්ධන අරමුදල හා දිවිනැගුම (සමෘද්ධි) චක්‍රීය අරමුදල පිහිටුවා නොතිබුණි. | පනත ප්‍රකාරව අරමුදල් පිහිටුවීමට කටයුතු කළ යුතු බව. | භාණ්ඩාගාරයෙන් ඉල්ලා ඇති උපදෙස් ලද වහාම අරමුදල් දෙක ආරම්භ කිරීමට කටයුතු කරන බව. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 10 වන ඡේදය හා 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා පැමිණීමේ හා පිටවීමේ වේලාවන් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ හෝ ලේඛනයක සටහන් නොකර සමාලෝචිත වර්ෂයේ දින 39 ක් සඳහා නිවාඩු දින රාජකාරි දීමනාව ලෙස රු. 232,144 ක් ලබාගෙන තිබුණි. | ආයතන සංග්‍රහයේ හා චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කළ යුතු බව. | අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර තිබූ බැවින් ගෙවීම් කළ බව. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි
---------------------------

| | | | |
|---|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 135 හා 381(1) | පුහුණු මධ්‍යස්ථානවල සියළුම කාර්යයන් මූල්‍ය පාලන බලතල පවරා දීමකින් තොරව අනුයුක්ත කාර්ය මණ්ඩලය විසින් සිදු කර තිබුණි. තවද, පුහුණු මධ්‍යස්ථාන 03 ක භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව බැංකු ජංගම ගිණුම් පවත්වා ගෙනගොස් තිබුණි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | ඉදිරියේදී මේ පිළිබඳව කටයුතු සිදු කරනු ලබන බව. |
| (ii) මුදල් රෙගුලාසි 138 | නව සහනාධාර හිමිකම්පත් බෙදා දීමේ ප්‍රසම්පාදනයන් 03 ක් සඳහා රු. 56,844,400 ක් ගෙවීම් කිරීමේදී මූල්‍ය පාලන බලතල නිලධාරියා වෙනුවට විෂය ලිපිකරු විසින් සහතික කර ගෙවීම් කර තිබුණි. | මූල්‍ය පාලන බලතල සීමාවන්ට අනුකූලව ක්‍රියා කළ යුතු බව. | සමෘද්ධි අධිකාරි සමයේ සිට පැවත ආ විෂය ලිපිකරුගේ අත්සන යෙදීමේ පූර්වාදර්ශය මත සිදුව ඇති ක්‍රමය මේ වනවිට වෙනස් කර ඇති බව. |
| (iii) මුදල් රෙගුලාසි 396 (ඇ) | මාස 06 කට වැඩි කාලයක් ඉදිරිපත් කර නොතිබූ රු. 1,750,348 ක් වටිනා චෙක්පත් 13 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. |
| (iv) මුදල් රෙගුලාසි 1647 (අ) හා 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහන 140 ක් සම්බන්ධයෙන් වාහන පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමටත්, වාහනවල දෙපාර්තමේන්තුවේ නම හා රාජ්‍ය ලාංඡනය යෙදීමටත් කටයුතු කර නොතිබුණි. | රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | වාහනවල සමීක්ෂණ කටයුතු සිදු කර අවසන් කිරීමටත්, සියළුම වාහනවල රාජ්‍ය ලාංඡන යෙදීමටත් කටයුතු කරනු ලබන බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව තුළ පවත්වාගෙන යනු ලබන සමාජ ආරක්ෂණ භාර අරමුදල, නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල, බැංකු සංගම් ලිපි ද්‍රව්‍ය චක්‍රීය අරමුදල, සේවක ණය චක්‍රීය අරමුදල, හා සමෘද්ධි අරමුදල පවත්වා ගෙනයාමේ අවශ්‍යතාවය සලකා බලා ඒවා ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | පනතෙහි 45 වගන්තිය ප්‍රකාරව මෙම අරමුදල් ව්‍යවස්ථාපිත අරමුදල් ලෙස පිළිගෙන ඇති බව. |
| (ඉ) | 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කාර්ය නිම වූ වහාම ලබාදුන් අතුරු අග්‍රිමය පියවිය යුතු නමුත් නිලධාරීන් 31 දෙනෙකුට අවස්ථා 59 කදී ලබාදුන් රු. 817,734 ක අත්තිකාරම් පියවීමට දින 07 ක සිට මාස 09 ක් දක්වා කාල පරාසයක් ගතකර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අතුරු අග්‍රිම පියවීම කඩිනම් කිරීමට කටයුතු කර ඇති බව. |

### 1.6.11 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නව සමෘද්ධි සහනාධාර බෙදා දීමේ උත්සවයේ භාණ්ඩ සඳහා ගෙවූ වැට් බදු රු. 16,105,597 ක් සම්බන්ධයෙන් විගණකාධිපතිට පිටපත් සහිතව දේශීය ආදායම් කොමසාරිස්ට දැනුම් දී නොතිබුණි. තවද, ඉන් රු. 8,437,500 ක වැට් බදු ගෙවීම් කර තිබූ සැපයුම්කරු අක්‍රීය බදුකරුවකු විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් මත අදාළ ලිපි ගොනුව දේශීය ආදායම් කොමසාරිස් වෙත බාරදීමට කටයුතු කරමින් පවතින බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිමය රු. 67,312,955,000 ක් විය. එසේ වුවද, සැලසුම් සංශෝධනය කිරීමට කටයුතු නොකර ඊට වඩා රු. 3,289,485,000 ක් අඩුවෙන් රු. 64,023,470,000 ක අග්‍රිම ඉල්ලුම් කර තිබූ අතර ලැබුණු අග්‍රිමය රු. 6,038,030,000 ක් පමණක් විය. | අග්‍රිම සැලසුම් කර ඉල්ලුම් කළ යුතු බව. | අග්‍රිම සැලසුම් කිරීම අදියර 2 කින් සිදු වීම, ප්‍රග්ධන වැය 25% කින් කපා හැරීම, වැන්දඹු අනත්දරු ක්‍රමයට දායක වීමේ සේවක සංඛ්‍යාව වැඩි වීම යනාදිය හේතුවෙන් සැලසුම් කළ අග්‍රිමය ඉල්ලුම් කිරීමට සිදු නොවූ බව. |
| (ආ) ප්‍රධාන කාර්යාල නිල බැංකු ගිණුමට සෘජුව බැර වී තිබූ රු. 7,310,779 ක් මුදල් පොතට ගැලපීමට කටයුතු නොකර රු. 5,972,767 ක් බැංකු සැසඳුමට හා රු. 1,338,012 ක් පොදු තැන්පත් ගිණුමට ගලපා තිබුණි. තවද, බැංකුවෙන් මුදල් කර ගෙන තිබූ රු. 2,402,752 ක චෙක්පත් 03ක් ඉදිරිපත් නොකළ චෙක්පත් වශයෙන් බැංකු සැසඳුමට ඇතුළත් කර තිබුණි. ඉහත හේතූන් නිසා භාණ්ඩාගාරයට අග්‍රිම පියවීමේ නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය. | මුදල් පොත හා බැංකු සැසඳුම් ප්‍රකාශ නිවැරදි කර භාණ්ඩාගාරයට අග්‍රිම පියවීම නිවැරදි කළ යුතු බව. | ඉදිරියේදී මෙවැනි දෝෂ ඇතිවීම වළක්වා ගැනීම සඳහා පියවර ගෙන ඇති බව. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල නොකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයකට මාරුකරගත් රු. 3,000,000 ක ප්‍රතිපාදයෙන් රු. 1,085,353 ක් හෙවත් සියයට 36 ක් ඉතිරි වී තිබුණි. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු බව. | ප්‍රතිපාදන මාරු කිරීම සඳහා අනුමැතිය ලැබෙන විට දිස්ත්‍රික් කාර්යාල ගිණුම් පියවා අවසන්ව තිබීමත්, අක් මුදල් ප්‍රමාණවත්ව නොලැබීමත් හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාග්ධන වැය විෂයයක හා පුනරාවර්තන වැය විෂයයන් 02 ක වෙන් කළ ශුද්ධ ප්‍රතිපාදනය පිළිවෙලින් රු. 500,000 ක් හා රු. 300,000 ක් සම්පූර්ණයෙන් ඉතිරි කර තිබුණි. | -එම- | ඇස්තමේන්තු ප්‍රතිපාදන සැලසුම් කර ඇති පරිදි වියදම් කිරීම සඳහා නිලධාරීන්ට අවශ්‍යය උපදෙස් ලබා දෙන බව. |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයයන් 07 ක රු. 13,300,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු කළ පසුව ද රු. 3,612,248 ක් හෙවත් සියයට 16 ක සිට සියයට 82 ක් අතර පරාසයකින් ඉතිරි වී තිබුණි. තවද, ප්‍රාග්ධන වැය විෂයයන් 7 ක රු. 20,400,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 17,027,352 ක් හෙවත් සියයට 26 ක සිට සියයට 73 ක් අතර පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | -එම- | නව සහනාධාර නිකුත් කිරීම් සහ පත්වීම් බෙදාදීම් වැනි කාර්යයන්ට ප්‍රමුඛතාවය ලබාදීම මත පූර්වයෙන් සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට නොහැකි වූ බව හා ඉදිරියේදී නිසි පරිදි කටයුතු කිරීමට පියවර ගන්නා බව. |

**2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය, මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ හා සේවය හැරගිය නිලධාරීන් 204 දෙනෙකුගෙන් මාස 03 ක සිට වර්ෂ 05 කට වැඩි කාල පරාසයක සිට අයවීම් හිඟහිටව තිබුණු ශේෂවල එකතුව රු. 3,976,559 ක් විය. | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1 හා 3 ඡේද ප්‍රකාරව හා ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු බව. | නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ කාර්යයන් අවසන් නොවීම සහ වැඩ තහනම් කළ නිලධාරීන්ගේ විනය පරීක්ෂණ කටයුතු අවසන් නොවීම මත මෙම අයකිරීම් අවසන් කිරීමට නොහැකි වී ඇති බව. |
| (ආ) | අයවිය යුතු ණය රු. 563,454 ක් ගිණුමට ඇතුළත් නොකිරීම හා වැඩිපුර අයකරගත් රු. 234,000 ක් අයවිය යුතු ණය ශේෂයට හිලව් කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් අයවිය යුතු ණය ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. තවද, එකතුව රු. 114,809 ක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරීන් සඳහා ණය නිකුත් කිරීම, ණය අයකර ගැනීම හා අයවිය යුතු ශේෂය ගණනය කිරීම යනාදිය නිවැරදිව සිදු කළ යුතු බව. | වැඩිපුර අයකරගත් ණය ශේෂ අදාළ නිලධාරීන්ට ගෙවීමේ කාර්යය කඩිනම් කරමින් පවතින බව.<br>අනෙකුත් නිරීක්ෂණ සඳහා පිළිතුරු ලබා දී නොමැත. |

## 2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 09 ක රු.3,810,944 ක් වූ ඉතිරි කිරීම් රු.82,357,424 කින් ඉක්මවා රු. 86,168,368 ක බැරකම් ඇතිකර ගෙන තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව බැදීම්වලට එළැඹිය යුතු බව. | 2018 වර්ෂයේ බැරකම් නිදහස් කිරීමට සිදු වීම හා නව සහනාධාර බෙදාහැරීමේ වැඩසටහන් සඳහා අනපේක්ෂිතව වියදම් ඉහළයාම ඊට හේතු වූ බව හා මෙවැනි තත්වයන් ඇති නොවීමට අවශ්‍යය උපදෙස් නිකුත් කර ඇති බව. |
| (ආ) | වැය විෂයයන් 12 ක භාණ්ඩාගාර බැරකම් ප්‍රකාශනයට වඩා රු. 2,689,517,664 ක් වැඩියෙන් ද, වැය විෂයයන් 20 ක භාණ්ඩාගාර බැරකම් ප්‍රකාශනයට වඩා රු. 103,606,031 ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ සියළුම බැරකම් ඊළඟ වර්ෂයට ගෙන නොයා එම මුදල් වර්ෂය තුළදීම ගෙවා නිදහස් කළ යුතු බව. | සිගාස් ගිණුම්කරණ පද්ධතියට ප්‍රතිපාදන සීමාව තුළ එළැඹි බැරකම් පමණක් ඇතුළත් කළ හැකි බව හා ඇතැම් බැරකම් භාණ්ඩාගාරයට වාර්තා කිරීමෙන් අනතුරුව වටිනාකම වෙනස් වූ බව. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 හා 2017 වර්ෂවලදී තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් පිළිවෙලින් රු. 2,950,975 ක් හා රු. 436,815 ක් නිවැරදිව හඳුනා නොගෙන දිගින් දිගටම බැංකු සැසඳුම් ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි. | බැංකු සැසඳුම් ප්‍රකාශ නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු බව. | හිඟ සහනාධාර මුදල් ඍජු ප්‍රේෂණයක් වූ රු. 2,950,975 ක මුදල ඇතුළු දෝෂ නිවැරදි කර 2016 මාර්තු මස සිට සංශෝධිත බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කර ඇති බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1995 වර්ෂයේදී ආරම්භ කර තිබූ සමෘද්ධි සහනාධාර වැඩසටහන මඟින් දිළිඳුකම තුරන් කර ප්‍රජාව සවිබල ගැන්විය හැකි නිශ්චිත නිර්ණායක ඇතුළත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. තවද, වැඩසටහන් මෙහෙයවීම හා ප්‍රජාව සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා තොරතුරු පද්ධතීන් හඳුන්වාදීමට කටයුතු නොකිරීම, සමෘද්ධි ප්‍රජාමූල බැංකු ලාභ ඉපැයීම අරමුණු කරගනිමින් මෙහෙයවීම යනාදී කරුණු හේතුවෙන් ප්‍රජාව සවිබල ගැන්වීම නිසි පරිදි ක්‍රියාත්මක වන බවට නිරීක්ෂණය නොවීය. | දිළිඳුකම තුරන් කර ප්‍රජාව සවිබල ගැන්විය හැකි නිශ්චිත නිර්ණායක හඳුනාගෙන ජාතික ප්‍රතිපත්තියක් සකස් කළ යුතු බව. | සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීමේ අරමුණ ඉටුකර ගැනීම සඳහා සමෘද්ධි බැංකු පද්ධතිය ආරම්භ කර තැන්පත් වර්ධන වැඩසටහන් හා ණය වැඩසටහන් හඳුන්වා දී ඇති බව. |

## 3.2 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට ජීවනෝපාය සංවර්ධන වැය විෂයය යටතේ රු. මිලියන 675 ක් වැය කර ඉටු කිරීමට අපේක්ෂිත වැඩසටහන් පමණක් ඇතුළත් කර තිබුණි. එසේ වුවද, 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව යාවත්කාලීන කළ සංවිධාන ව්‍යුහය, අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු බව. | අදහස් දක්වා නොමැත. |

**3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීම සඳහා ප්‍රතිපාදිත රු.192,434,820 කින් ඉටුකිරීමට සැලසුම් කරන ලද ප්‍රධාන කාර්යයන් 02 ක් හා ව්‍යාපෘති 7,868 ක් ද, රු. 7,326,946 ක ප්‍රතිපාදන යටතේ පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙනා ව්‍යාපෘති 70 ක් ද ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | සැලසුම් කළ ක්‍රියාකාරකම් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු බව. | අදහස් දක්වා නොමැත. |
| (ආ) දිස්ත්‍රික්ක 23 ක යටිතල පහසුකම් ව්‍යාපෘති 124 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදනය කර ගත් රු. 180,974,940 ක මුදලින් රු. 116,593,996 ක් වැය කර අම්පාර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 79 ක් ද, රු. 8,141,859 ක් වැය කර තවත් දිස්ත්‍රික්ක 11 ක ව්‍යාපෘති 13 ක් ද ක්‍රියාත්මක කර තිබුණි. ඉතිරි දිස්ත්‍රික්ක 11 සඳහා කිසිදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. | දිවයින පුරා සංවර්ධනය කළ යුතු යටිතල පහසුකම් හඳුනා ගෙන ප්‍රතිපාදන වෙන් කර ඒ අනුව කළ යුතු බව. | වර්ෂයේ මුල් ක්‍රියාකාරී සැලැස්ම මඟින් සියළු දිස්ත්‍රික්ක සඳහා රු. මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර තිබු බව. |
| (ඇ) වැඩසටහන් 03 ක ක්‍රියාකාරකම් 03 ක් සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මෙන් වෙන්කර ගත් රු.8,750,000 ක මුදල රු. 3,870,000 කින් ඉක්මවා රු. 12,620,000 ක් වැයකර තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කොට අදාළ වෙනස්කම් සිදු කළ යුතු බව. | අදහස් දක්වා නැත. |

**3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**--------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ කාර්යසාධන වාර්තාවට 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ඇතුළත් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තාවට විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ඇතුළත් කළ යුතු බව. | අදහස් දක්වා නොමැත. |

## 3.5 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතුළත් මාර්ගෝපදේශයන් ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැසුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තුව සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබූ අතර වර්ෂයේ සමස්ථ අයවැයගත ප්‍රතිපාදනය සඳහා සැලසුම් සකස් කර නොතිබුණි. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැසුම් පිළියෙල කළ යුතු බව. | අදහස් දක්වා නොමැත. |

## 3.6 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රු. 2,300,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ සමනල වැව පුහුණු මධ්‍යස්ථානය පිහිටි හෙක්ටයාර් 2.178 ක ඉඩම් කොටස අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර රු. 132,746,000 කට තක්සේරු කර තිබූ නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානයේ ඉඩම හා ගොඩනැගිලි පවරා ගැනීමට හා එම ඉඩමේ අනවසර පදිංචිකරුවන්ගෙන් අයවීමට ඇති රු. 525,000 ක තක්සේරු වටිනාකම අය කරගෙන ඉඩම් කොටස් පවරා දීමට ද කටයුතු කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැඟිලි දේපල අත්පත් කර ගැනීමේ හා පවරා ගැනීමේ කටයුතු අප්‍රමාදීව ඉටු කළ යුතු බව. | සමනල වැව පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩම් කොටස අත්පත් කර ගැනීමට ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර ඇති බව, නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානයේ ඉඩම හා ගොඩනැගිලි පවරා ගැනීමේ කටයුතු සිදු කරන බව හා අනවසර පදිංචිකරුවන්ගෙන් මුදල් අය කර ගැනීම ගැටළුකාරී වී ඇති බව. |

## 3.7 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව රජයේ මුදල්, ආදායම්, මුද්දර හා බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටින හා පරිපාලනමය වශයෙන් වගකිව යුතු සහ රජයේ ගිණුමට අදාළව වගකීම් පැවරී ඇති නිලධාරීන් ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබීම් කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව ඇප තැබීමට කටයුතු කළ යුතු බව. | අදහස් දක්වා නැත. |

## 3.8 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන විමසුම පිළිබඳ විස්තරය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට හා සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 09 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, ප්‍රමාද කාලය මාස 01 ක සිට වසරක් ඉක්ම වූ කාල පරාසයක් වී තිබුණි. එම විමසුම්වලට අදාළව ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. මිලියන 10,084.42 ක් විය. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ගණන් දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452(1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය පරීක්ෂා කර විගණන විමසුම්වලට වහාම පිළිතුරු ලබා දිය යුතුය. | අදහස් දක්වා නොමැත. |

## 3.9 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පුහුණු වැඩසටහන් පැවැත්වීම පිළිබඳව වාර්ෂික සැලසුම් සකස් කර නොතිබූ අතර හා පුහුණු මධ්‍යස්ථාන පාලනය කිරීම ප්‍රධාන කාර්යාලයේ අධීක්ෂණයෙන් බැහැරව සිදු කර තිබුණි. | වාර්ෂික පුහුණු සැලසුම් සකස් කොට පුහුණු මධ්‍යස්ථාන අධීක්ෂණයට යටත් කළ යුතු බව. | අක් මුදල් නොලැබෙන හෙයින් වාර්ෂික පුහුණු සැලසුම් සකස් කිරීම ප්‍රායෝගික නොවන බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සහනාධාර ප්‍රදානය කිරීමේ උත්සව පැවැත් වීම සඳහා සමාජ ආරක්ෂණ භාර අරමුදලෙන් රු. 218,493,601 ක් හා ප්‍රජාමූල බැංකු අංශයෙන් රු. 100,000,000 ක් වශයෙන් ලබාගත් මුදල් පියවීමට කටයුතු කර නොතිබුණි. | අයවැය ප්‍රතිපාදනවලින් බැහැරව දරන ලද වියදම් පියවීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව. | පිළිතුරු පසුව සපයනු ලබන බව. |
| (ඇ) | නව සමෘද්ධි සහනාධාර අයදුම්පත් පරිගණකගත කිරීම හා ඊට අදාළ ලිපි විවෘත කර බෙදා වෙන් කිරීම සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමකින් තොරව එක් අයදුම්පතකට රු. 6 ක් බැගින් නිත්‍ය කාර්යමණ්ඩලයට රු. 2,444,074 ක දීමනාවක් ගෙවා තිබුණි. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත යුතු බව. | රාජකාරී වේලාවෙන් පරිභාහිරව සිදු කරන ලද මෙම කාර්යයන් සඳහා සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදලෙන් ගෙවීම් කළ බව. |
| (ඈ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් හා ගබඩා පටිපාටිය අනුගමනය නොකර සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට පත්වීම් ලිපි බෙදා දීමේ හා උත්සවය පැවැත්වීමේ වියදම් රු. 14,681,351 ක් ද, ටයර් 72 ක් මිලදී ගැනීම සඳහා රු. 2,296,464 ක් හා සමෘද්ධි සහනාධාර ලබාදීමේදී ප්‍රසම්පාදනයන් 04 ක් සඳහා රු. 246,283,828 ක් ද වැය කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ හා හා මුදල් රෙගුලාසිවල ඇතුළත් උපදෙස් අනුව කටයුතු සිදු කළ යුතු බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා නොගැනීම හේතුවෙන් මේ ආකාරයට කටයුතු කර ඇති බව. |
| (ඉ) | දෙපාර්තමේන්තුව සතු වාහන 04 ක් රේඛීය අමාත්‍යාංශයට හා තවත් වාහනයක් වෙනත් අමාත්‍යාංශයකට ලබාදී තිබුණි. මේ අතරින් රේඛීය අමාත්‍යාංශයට ලබා දී තිබූ වාහන නඩත්තුවට රු. මිලියන 4.4 ක් වැය කර තිබුණි. | දෙපාර්තමේන්තුව සතු වත්කම් රෙගුලාසිවලට අනුකූලව අරමුණු ඉටු කර ගැනීම සඳහා යෙදවිය යුතු බව. | පසුව පිළිතුරු සපයනු ලබන බව. |
| (ඊ) | දෙපාර්තමේන්තුවට අයත් බවට සනාථ නොවූ කැබ් රථ 02 ක් හා මෝටර් බයිසිකල් 09 ක් සඳහා 2019/2020 කාල පරිච්ඡේදයට රු. 132,648 ක් වැය කර රක්ෂණ ආවරණ ලබා ගෙන තිබුණි. | අදාළ වාහනවල භාවිතය පිළිබඳව සොයා බැලිය යුතු බව. | පසුව පිළිතුරු සපයනු ලබන බව. |

| | | | |
|---|---|---|---|
| (ඩ) | සංචිත වාහන 09 ක් අවසරයකින් තොරව රාත්‍රි කාලයේදී බැහැර නවතා තිබීම, කාර් රථයක් කි.මී. 593 ක දුර ප්‍රමාණයක් අනුමැතියකින් තොරව ධාවනය කර තිබීම, නිර්දේශ හා නිකුතු නියෝග රහිතව වාහන 32 ක් සඳහා ඉන්ධන ලීටර් 4,975 ක් නිකුත් කර තිබීම, ආදී කරුණු හේතුවෙන් වාහන විධිමත් පරිදි පරිහරණය කර නොතිබූ බව අනාවරනය විය. | වාහන සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලනයක් පවත්වා ගත යුතු බව. | පසුව පිළිතුරු සපයනු ලබන බව. |
| (ඪ) | සමාලෝචිත වර්ෂයේදී සමෘද්ධි සංවර්ධන නිලධාරී පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබා දී නොතිබියදී 2017 තරඟ විභාගයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණ පවත්වා ලකුණු ලබාදුන් අපේක්ෂකයන් 3,673 දෙනෙකු නැවත වරක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමට රු. 606,692 ක් වැය කර තිබුණි. එසේ වුවද, අදාළ බඳවා ගැනීම් සිදු නොවීම හේතුවෙන් එම වියදම නිෂ්කාරය වී තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන බඳවා ගැනීමට අදාළ කටයුතු කළ යුතු බව. | හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් මත සිදු කර ඇති මෙවැනි අක්‍රමවත් ක්‍රමවේද ඉදිරියේදී සිදු නොවීමට වග බලා ගන්නා බව. |
| (ණ) | දිස්ත්‍රික්ක 21ක පොරොත්තු ලේඛනවල ඇතුළත් පවුල් 589,472 කින් පවුල් 135,106 කට සමෘද්ධි සහනාධාර ලබා දී නොතිබුණි. එසේම ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පොරොත්තු ලේඛනවල ඇතුළත් පවුල් 43,853 කින් පොරොත්තු අනුපිළිවෙලින් බැහැරව තෝරාගත් පවුල් 33,398 කට සහනාධාර ප්‍රදානය කර තිබුණි. | ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ඒ අනුව සහනාධාර ප්‍රදානයන් සිදු කළ යුතු බව හා ප්‍රතිලාභීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කළ යුතු බව. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2030 වර්ෂය වන විට දුගීබවින් තොර සමෘද්ධිමත් රටක් බවට ශ්‍රී ලංකාව පත් කර ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා දර්ශකවලට අනුකූලව සැලසුම් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා දර්ශක හදුනාගෙන ඒ අනුව කටයුතු කළ යුතු බව. | අදහස් දක්වා නැත. |

**5. යහපාලනය**

**5. 1 විගණන හා කළමනාකරණ කමිටුව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විගණන හා කළමනාකරණ කමිටුව මගින් විගණකාධිපති වාර්තා නිසි පරිදි සමාලෝචනය කර ඌනතාවයන් යළි ඇතිවීම වළක්වාලීම පිණිස අවශ්‍ය නිවැරදි පියවර ගෙන නැති හෙයින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යයන් නිසි පරිදි ඉටු වී නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්යයන් නිසි පරිදි ඉටු කළ යුතු බව. | අදහස් දක්වා නොමැත. |

## 6. මානව සම්පත් කළමනාකරණය

2019 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්යමණ්ඩලය පිළිවෙලින් 26,430 ක් හා 25,412 ක් වූ අතර දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 12,823.44 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුගත තනතුරු 4 ක් සඳහා සේවා ව්‍යවස්ථා හා බඳවාගැනීමේ පටිපාටි සහ තනතුරු 13 ක් සඳහා උසස් කිරීමේ පරිපාටි අනුමත කරගෙන නොතිබුණි. | කටයුතු කඩිනම් කර පරිපාලන ගැටළු විසඳා ගත යුතු බව. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | දෙපාර්තමේන්තුගත තනතුරු 6 ක් සම්බන්ධයෙන් අතිරික්ත කාර්ය මණ්ඩලයක් 172 ක විය. | අතිරික්ත කාර්ය මණ්ඩලයක් පවත්වාගත නොහැකි බව. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ දිස්ත්‍රික් අධ්‍යක්ෂ තනතුරු 06 ක් හා ගණකාධිකාරී I ශ්‍රේණියේ තනතුරු 16 ක් වැඩ බැලීමේ හා වැඩ ආවරණය කිරීමේ පදනමින් අනුයුක්ත කිරීම් කර තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය තුළ නිසි පරිදි පත්කිරීම් කළ යුතු බව. | අදහස් දක්වා නොමැත. |